# ගගේ බණ්ඩාර දෙවි (රාවණා රජු) පුද ලබන ලකේගල අඩුක්කු පූජාව : මානවවංශ පුරාවිද්‍යාත්මක පර්යේෂණයක් (ලග්ගල, මීමුරේ ඇසුරින්)

**වසන්ත කේ. දිසානායක**
භාෂා අධ්‍යයන අංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.
*dwasanta@yahoo.com*

ප්‍රමුඛ පද : ජන විඥානය, ප්‍රාග් ඓතිහාසික මානවයා, අඩුක්කු පූජාව, පූජා විධි

## හැඳින්වීම

ජනශ්‍රැතිය (Folklore) හා ජන විඥානය (Indigenous knowledge) තුළ සැඟව පවත්නා ඓතිහාසික තොරතුරු පිළිබඳ ව සිදුකරන අන්තර් සංස්කෘතික අධ්‍යයන (Cross cultural learning) පැරණි ඉතිහාසය හා මානවවංශ පුරාවිද්‍යාත්මක සාක්ෂි රැස් කිරීමට යම් පෙළඹවීමක් සිදුකරන්නේ යැයි පැවසීම යුක්තියුක්ත ය. උක්ත පසුබිම විවරණය කරන සාක්ෂියක් ලෙසට **ලග්ගල මීමුරේ** ප්‍රදේශයේ ප්‍රචලිත **ගගේ බණ්ඩාර (රාවණා රජු) දේව ඇදහිල්ල** නම් කළ හැකි ය. ලග්ගල ප්‍රදේශාශ්‍රිත ව ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික යක් ගෝත්‍රිකයන් හා ඓතිහාසික යුගයේ ජීවත් වූ මනුෂ්‍යයන් එක ම පූජාසනයක තබා පිදුම් ලබන අඩුක්කු පූජා කර්මය හඳුනාගත හැකි ය (ගුණතිලක, 2016).

ඉතිහාසය තුළ සැඟ ව පවතින ඇතැම් සිදුවීම් පිළිබඳ විශ්වසනීය සාක්ෂි ජන විඥානය තුළින් කලඑළි වන්නේ ද යන්න මෙහි පර්යේෂණ ගැටළුවයි.

තත් පර්යේෂණ පත්‍රිකාවේ අපේක්ෂිත අරමුණු වන්නේ ආදි කල්පිත ජන විඥානික පූජා කර්මයක් වූ මී මුරේ, ලග්ගල ආශ්‍රිත ව රාවණ රජු ප්‍රමුඛ යක්ෂ ගෝත්‍රිකයින් දේවත්වයෙන් පුදදෙන අඩුක්කු පූජාව තුළින් ලාංකේය ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයාගේ ජන විඥානික සාක්ෂි විවරණය කිරීමයි.

## ක්‍රමවේදය

උක්ත පර්යේෂණය 2016.03.10 දින ලකේගල ලග්ගල නාරංගමුවේ කේ.ජී. ගුණතිලකගේ නිවසේ පැවැති අඩුක්කු පූජාව ඇසුරින් සිදු කෙරේ. මෙහි දී ප්‍රධාන පර්යේෂණ ක්‍රමවේදය වූයේ ක්ෂේත්‍ර අධ්‍යයනය හා සහභාගීත්ව නිරීක්ෂණයයි. උක්ත දිනයේ පැවැති අඩුක්කු පූජා කර්මය ආරම්භයේ සිට අවසානය තෙක් ඊට සහභාගී වී නරඹා නිරීක්ෂණය කිරීමත් අවශ්‍ය දෑ ඡායාරූප ගැනීම හා වීඩියෝ පටවලට

ගැනීමත් සිදු කෙරුණි. මෙකී පූජා කර්මය සඳහා සහභාගී වූ ඇඳුරන් සමග සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් තොරතුරු ලබා ගැනීම සිදු විය. ද්විතීයික මූලාශ්‍ර අධ්‍යයනයේදී තත් විෂයානුබද්ධ පතපොත පුස්තකාල පරිශීලනයෙන් සිදු විය.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

රාවණා රජු හා ඔහුගේ රාජ්‍යය පිළිබඳ සංකල්පය වර්තමානයේ නොයෙකුත් විවාදයන්ට ලක් ව පවතී. පුරාවිද්‍යාත්මක සාක්ෂි නොලැබෙන තාක් එ වැන්නක් පිළිබඳව අදහස් පළකිරීමට පුරාවිද්‍යාඥයින් ඉදිරිපත් නොවේ. ඉතිහාසය තුළ ද පවතින්නේ ද න්‍යායාත්මක පසුබිමකි. ජයරත්න පතිරආරච්චි රචනා කරන්නට යෙදුණු **දකුණු සිරිපතුළ පිහිටි මක්කම** කෘතිය තුළ රාවණ රජු හා බුදුන් වහන්සේට සම කාලීන යැයි පැවසෙන සෙල්ලිපි කිහිපයක් පිළිබඳ අනාවරණය කර ඇත (පතිරආරච්චි 2005). ලංකාවතාර සූත්‍රය, රාමායණ මහා කාව්‍යය මෙන් ම ලක්දිව ප්‍රචලිත නොයෙකුත් ජනප්‍රවාද ස්ථාන නාම දේවාල කෝවිල් ආදිය තුළින් තත් වෙසෙස පිළිබඳ නොයෙක් තොරතුරු අනාවරණය වෙමින් පවතී. උක්ත ඓතිහාසික ප්‍රවණතාව හෙළිකරන ජනවිඥානික සාක්ෂියක් ලෙසට තත් ප්‍රදේශාශ්‍රිත අඩුක්කු පූජාව හඳුනාගත හැකි ය. රාවණ රජු සීතා දේවිය සඟවා තැබූ ස්ථානයක් ලෙසට ජන විශ්වාසයේ පවතින ලග්ගල ප්‍රදේශය තුළ රාවණ ඇළ සීතා ගල රාවණ කොටුව ආදී ස්ථාන පිහිටා ඇත. රාම රාවණ යුද්ධයෙන් මියගිය රාවණා රජු තත් ප්‍රදේශාශ්‍රිත ව ගගේ බණ්ඩාර දෙවියන් නමින් දේවත්වයට පත් ව ජනතා පිදුම් ලැබීම විශේෂත්වයකි (ගුණතිලක 2016). රාවණා රජු පිළිබඳ ව ලග්ගල පී.ජී. කිරිබණ්ඩා පැවසූ ජන කවි කිහිපයක් මෙසේ ය.

උයන් ගොමුව පෙර සිට වැව් බන්දනා
රාම සැරෙන් එන වෙඩි සැර අසමානා
රාවණා යුදට එන වෙඩි සැර බිම්බානා
ඉල්මස අඳුර මී මුරෙ ලක දුම්බානා

සුන්දර රුවෙන් බැබලෙන මීමුරේ ගමට
හැම මහතුන් එනවා එය බලන්නට
රාවණා රජු විසින් කළ අගනේ අපට
සිරිලක කපා සැරියෝ බැයක් වැවට

මෙරට වාසිත යැයි විශ්වාස කරන යක්ෂ ගෝත්‍රිකයන්ගේ නිජබිමක් ලෙසට ද තත් ප්‍රදේශය මහාවංශයේ හත්වන පරිච්ඡේදය තුළින් අනාවරණය වේ (මහාවංශය, 1959:7 පරි). විජය රජු එළවා දැමූ කුවේණිය සිය දරු දෙදෙනා ද කැටුව යන්නේ තම නිජබිම වූ ලංකාපුර ප්‍රදේශයට බව එහි සඳහන් ය. එකී පසුබිම සනාථ කරන සාධක මීමුරේ ප්‍රදේශය හා ලග්ගල ලොග්ගල ප්‍රදේශාශ්‍රිත ව හඳුනාගත හැකි ය. උක්ත අඩුක්කු පූජාවේ අවසානයට පිදුම් ලබන්නේ කුවේණියගේ දේව ආත්මය බව පැවසේ. අඩුක්කු පූජාවේ පුද දෙන කී රොටී පස් පුළුටු ආදිය යක්ෂ තොවිල් වලදී පුද දෙන පූජාවන් වේ. තත් පූජා කර්මයේ නර්තනයන්හි යෙදෙන ඇඳුරන්ගේ සියලු නර්තන විලාශ හුඳෙක් සිහි ගන්වන්නේ වැදි ජනයාගේ කිරි කොරහ, රුවල නැටීම ආදී යක් පූජා කර්මයන්හි සිදු කරන නර්තන විලාශයයි. මෙම පූජා

කර්මයේ පුද ලබන කැලේ බණ්ඩාර දෙවි යක් දෙවි කෙනෙක් බව ඔහුගේ උපත් කතාව තුළ අන්තර්ගත වේ. ලග්ගල විසූ යක් සෙනෙවියා විජය රජු අතින් මිය යෑමෙන් පසු ව ඇගේ බිරිඳ නන්දනී දින හතකින් දරුවකු බිහි කළ බවත් ඒ මොහොතේ ඇය මියගිය බවත් ජන විශ්වාසයයි. කැලයේ තනි වූ අලුත උපන් බිළිදා වන සතුන්ගේ ඇසුරේ වර්ධනය වූ බවත් ලග්ගල තිබූ නිධන් ඔහුට ලැබුණු බවත් පසු ව ඔහු කැළේ බණ්ඩාර දෙවියන් නමින් ප්‍රකට වූ බවත් තත් ප්‍රදේශාශ්‍රිත ව දිවි ගෙවන ගැමියන් අපට පැවසී ය. මීට අමතර ව කන්දෙ දෙවි අලුත්නුවර දේවතා බණ්ඩාර මංගර වන්නි බණ්ඩාර කහටගහ කුඹුරේ දෙවි මින්නේරි දෙවි හා ආස්ථාන දෙවි උක්ත අඩුක්කු පූජාවේ පිදුම් ලබන්නෝ වෙති. මෙකී සියලු දෙවිදේවතාවන්ගේ උපත් කතා තුළ යක්ෂ සම්භවය මෙන් ම යක්ෂ ගෝත්‍රිකයින් හා පැවැති සබැඳියාව හෙළිවීම විශේෂත්වයකි. ඒ තුළින් ගම්‍යමාන වුයේ යක් ගෝත්‍රිකයිනගේ නිජ බිමක් ලෙසට මෙම ප්‍රදේශය පැවති බවයි.

අපගේ පර්යේෂණය තුළින් ඉතිහාසය තුළ සැඟ ව පවතින ඇතැම් සිදුවීම් පිළිබඳ විශ්වසනීය සාක්ෂි ජනවිඥානය තුළින් කලඑළි වේ යැයි නිගමනය කළ හැකි ය. ආදි කල්පිත ජන විඥානික පූජා කර්මයක් වූ මී මුරේ ලග්ගල ආශ්‍රිත ව රාවණ රජු ප්‍රමුඛ යක්ෂ ගෝත්‍රිකයින් දේවත්වයෙන් පුද දෙන අඩුක්කු පූජාව තුළින් ලාංකේය ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයාගේ තොරතුරු ජන විඥානික පුද පිළිවෙත් මූලාශ්‍ර කරගනිමින් සාක්ෂි විවරණය වන බව සනාථ විය.

## ආශ්‍රිත ග්‍රන්ථ


ගුණතිලක, කේ.ජී. සම්මුඛ සාකච්ජාව. 2016.03.10 ලකේගල ලග්ගලඃ (අඩුක්කු පූජා කර්මයේ ප්‍රධාන කපු මහතා).

මහාවංශය, 1959. (සංස්.) ශ්‍රී සුමංගල නාහිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත පණ්ඩිතුමා, ප්‍රථම භාගය.

පතිරආරච්චි, ජයරත්න, 2005. දකුණු බුදු සිරිපතුල පිහිටි මක්කම සහ රාවණ රජුගේ සෙල්ලිපි, බොරලැස්ගමුවඃ උදය ග්‍රැෆික්ස්.